පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

පළමු වාරය - පෙබරවාරි - 3 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

<u>තොරතුරු පත්‍රිකාව</u>

# චරිතවලට සමාරෝපය වෙමු.

කිසියම් පුද්ගලයෙකු පවතින යථා සවරූපයෙන් බැහැර වී වෙනත් අයෙකුගේ විලාසය ආරෝපණය කර ගැනීම සමාරෝපයයි. සමාරෝපයේ පදනම අනුකරණයයි. ආදි කාලයේ සිට ම මිනිසා අනුකරණයට දක්වන්නේ සහජ ලැදියාවකි.

වේදිකාවේ දී විවිධ චරිත නිරූපණය කිරීමට අපට සිදු වේ. ඇතැම් චරිත සමාජයේ දී අපට මුණගැසෙන, කතා බහ කරන චරිත විය හැක. ඇතැම් විට අප කිසිදා නොදුටු මනෝමය චරිත ද විය හැක. පරිකල්පයෙන් මවා ගන්නා චරිත ක්‍රියා කරන ආකාරය තම සිරුර උපයෝගී කොට ගෙන ආංගික වාචික, සාත්වික, ආහාර්ය අභිනය භාවිතා කරමින් යම් චරිතයක් කර පෙන්වීම චරිත නිරූපණයයි. මෙම චරිත සඳහා ආරෝපණය වීමට බාහිර සමාරෝපය සහ අභ්‍යන්තර සමාරෝපය ප්‍රබල දායකත්වයක් නළුවාට සපයා දෙයි.

චරිතයක් නිරූපණය කිරීමේ දී,

- නළුවාට
  - අණුකරණය
  - සතර අභිනය
  - සමාරෝපය

**අභ්‍යන්තර සමාරෝපයේ දී -**

චරිතය අධ්‍යයනය කරමින් චරිතයේ සිතුවිලි ක්‍රියා කරන ආකාරය, කතා බහ, යන එන අකාරය, ඒ ඒ චරිතයට අවේණික ගති ලක්ෂණ අනුකරණය කරයි.

**බාහිර සමාරෝපයේ දී -**

I. පුද්ගල සමාරෝපය - චරිතයකට ප්‍රවිශ්ට වීමයි.
II. ද්‍රව්‍යමය සමාරෝපය - චරිතයට අදාළ උපකරණ ගෙන ප්‍රවිශ්ට වීම.
III. ස්ථානීය සමාරෝපය - චරිතය ගැවසෙන ස්ථානය අනුව ප්‍රවිශ්ට වීම.

නළු කාර්යය සාර්ථක වීමට නම් එම චරිතය සිදු කරන නළුවා බාහිරව මෙන් ම අභ්‍යන්තරව ද සමාරෝපගත විය යුතු ය.



## පැවරුම

1. ඔබ නැරඹූ නාට්‍යයක ඔබ වඩාත්ම සිත්ගත් චරිතය බාහිර වශයෙන් සමාරෝපය වී සිටි ආකාරය ලියන්න.
2. එම චරිතය තුළ ඔබ දකින ලද අභ්‍යන්තර සමාරෝපයේ ලක්ෂණ ලියන්න.
3. බාහිර සමාරෝපය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ආනුෂංගික අංග නම් කරන්න.